# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1881/37 – 2014 සැප්තැම්බර් 25 වැනි බ්‍රහස්පතින්දා – 2014.09.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, මදුරාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මදුරාවල ගමේ පිහිටි කළුතර දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරිගේ අංක කේජ්/එම්ඩීආර්/14/160පී හා 2014.07.25 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් කැබලි අක්ෂර 'ඒ' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 1.0898ක් පමණ වන පහත නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – ගොඩකුඹුරෙඹිවිට සහ කජුගහඹිවිට – ප්‍රමාණය: හෙක්. 1.0898

උතුරට: මාර්ගය (මා.සං.අ.); නැගෙනහිරට: මාර්ගය (මා.සං.අ.), එම්. හෙන්රි රූපිකා වීරසිංහ සහ සුමනරත්න සේනාධීර හිමිකම් කියන ගොඩකුඹුරඹිවිට; දකුණට: ලක්ෂ්මන් ප්‍රියංකර සහ තවත් අය හිමිකම් කියන දෙමටහැත්ත කුඹුර, කරුණාමුනි විජේසිරි සිල්වා සහ එස්. ඒ. ධර්මදාස හිමිකම් කියන කදුරුගහඹිවිට; බටහිරට: ලක්ෂ්මන් ප්‍රියංකර සහ තවත් අය හිමිකම් කියන දෙමටහැත්ත කුඹුර, කරුණාමුනි විජේසිරි සිල්වා සහ එස්. ඒ. ධර්මදාස හිමිකම් කියන කදුරුගහඹිවිට.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: 4-3/6/2013/එච්ඩබ්ලිව්/664.
2014 සැප්තැම්බර් මස 24 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

10 - 434